


**දඟ ළමයා**

අම්මා -- මොකද මේ තාම නිදි, නැගිටපන් දැන් පරක්කු වෙලා
නිමල් -- අම්මේ මට ඉස්කෝලෙ යන්න බෑ අම්මෙ, මට යන්න බෑ
අම්මා -- එහෙම කියල කොහොමද පුතේ උඹ ඉස්කෝලෙ යන්න එපයි
නිමල් -- ඒ උනාට මට බෑ අම්මේ
අම්මා -- ඇයි ඒ ,ඉක්මනට ලේස්ති වෙයන් දැන් පරක්කුත් වෙලා
නිමල් -- මට බෑ අම්මේ මට බෑ ! බෑ !! බෑ !!!
අම්මා -- ඒයි ෟ පොඩ්ඩක් එන්න , මූට ඉස්කෝලෙ යන්න බෑ කියනව.
තාත්තා -- මොකද උඹ ඉස්කෝලෙ යන්න බෑ කියන්නෙ,පලයන් ඉස්කෝලෙ
නිමල් -- මට ගුරුවරු කැමති නෑ, මට ළමයි කැමති නෑ, මට බෑ තාත්තෙ,
තාත්තා -- උඹේ බුරුල වැඩි ඇති, ගුරුවරුන්ටයි ළමයින්ටයි ටිකක් තදින් හිටපං

පිරිමියෙක් වගේ , උඹ ඉස්කෝලෙ ප්‍රින්සිපල්නෙ.




**ටක්කෙටම හරිගිය බේත**

වෛද්‍යවරයෙකු වෙත පැමිණි එක් වියපත් කාන්තාවක් විනාඩි 20 ක් පමණ කාලයක් තිස්සේ ඇයට ඇති රෝග විශාල සංඛ්‍යාවක් වෛද්‍යවරයාට කිවේය. සාමාන්‍යයෙන් මෙහිදී කරනුයේ ඇති ප්‍රධාන රෝගයට බෙහෙත් නියම කිරීමය. ඒ අනුව පෙති කිහිපයක් සහ බීමට සිරප් ලියා දුන්නේය, නික්ම ගිය ඇය වහවහා යළි පැමිණ ''අනේ මහත්තයෝ මට කියන්න බැරි උනා,මගේ මේ බෙල්ලෙ අමාරුවකුත් තියෙනවා" යැයි කීවාය, "ආ ඒකට මං ඔය දුන්න බොන බේතෙන් ටිකක් උදෙයි හවසයි ගාන්න" වෛද්‍යවරයා ඇය දෙසවත් නොබලා කිවේ ඇය යලිත් කතාවට ඒ යැයි බියෙනි.

දින කිහිපයකට පසු හැඩිදැඩි තරුණයෙකු සමඟ යළි ආ කාන්තාව දුටු වෛද්‍යවරයා තිගැස්සුනේ කැස්සට දුන් බෙහෙත බෙල්ලේ ගෑමෙන් පලක් නොවන බව කවුරුන් හෝ ඇයට කීවාද යන බියෙනි. එහෙත් ඇය කියා සිටියේ "අනේ මහත්තයෝ මගේ බෙල්ලෙ අමාරුව අර බේතෙන් නිට්ටාවටම සනීප උනා මගෙහිතේ, ඒත් අනික් ලෙඩවල් එකක්වත් සනීප උනේ නැහැනෙ'' කියමිනි .




**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au




දැන් ගෙම්බො කැගහන්නෙත් සජිත් සජිත් කියල
**රංගේ බණ්ඩාර මන්ත්‍රීතුමා**

දැන් ගෙම්බෝ දේශපාලකයෝ වෙන්න හදනවා.
චන්දෙන් පස්සේ දේශපාලකයෝ ගෙම්බෝ වෙන්න හදනවා,අනේ ගෙම්බන්ට ගිය රට
**අබරන්**